# නර්තනය - 10 ශ්‍රේණිය

## (පළමු වාරය )



The National e-learning Portal for the General Education

# හෝමාගම අධ්‍යාපන කලාපය
# ස්වයං අධ්‍යයන ඉගෙනුම් අත්වැල
# නර්තනය
# 10 ශ්‍රේණිය

ඒකකය- 23.1. වන්නම් නර්තනය
පැවරුම් අංක 01

- **වන්නම්,**
    - වන්නම් යන්නෙහි අරුත වර්ණනා කිරීම.
    - සම්ප්‍රදායන් තුනේම දක්නට ලැබෙන ශාස්ත්‍රීය නර්තන අංගයකි.
    - උඩරට වන්නම් 18කි. විනෝදාස්වාදය මුල්කොට ඇත. පහතරට වන්නම් 32 කි. දේවභක්තිය පදනම් කොට ඇත. සබරගමු වන්නම් 18කි. විනෝදය මුල්කොට ඇත.

## සිංහරාජ වන්නම

- සිංහයෙකුට සිදු වූ ඇබැද්දියක් පිළිබඳ විස්තර කරයි.
- දුරදිග නොබලා කටයුතු කිරීම අනුවණ ක්‍රියාවක් බව පෙන්වාදෙන අතර උපදේශනාත්මක වන්නමක් ලෙස පෙන්වා දියහැක.

තාලය- මහ (මාත්‍රා 4) තනිතිත
බෙර පදය- දො දොංත තකු දොං

තානම- තනත් තනෙන තම්- දනත් තනෙන තම්
දනත් තනෙන තම් දන තානා.... තන
තනත් තනෙන තම්- දනත් තනෙන තම්
දනත් තනෙන තම් දන තානා....
**(**තාලානුකූල හස්තචලන)

තානම- තනත් තනෙන තම්- දනත් තනෙන තම්
දනත් තනෙන තම් දන තානා.... තන
තනත් තනෙන තම්- දනත් තනෙන තම්
දනත් තනෙන තම් දන තානා....
**(**අලංකාර මාත්‍රය)

කවිය- පෙරත් කලෙක සිහ රජෙක් වැටුණි මහ ළිඳක් තුළක ඉබි ලඩෙක් කරපු වැඩ
ඇරත් මෙහෙම යස වැඩක් උණේ නැත චිරත් කලෙක පැවතුමක් යසයි හැඩ
**(**තාලානුකූල හස්තචලන)

තානම- තනත් තනෙන තම්- දනත් තනෙන තම්
දනත් තනෙන තම් දන තානා.... තන
තනත් තනෙන තම්- දනත් තනෙන තම්
දනත් තනෙන තම් දන තානා....
(අලංකාර මාත්‍රය)

කවිය- දුරත් බැලුම නොව ළඟත් බලන අය හටත් මෙලෙස වෙයි කැටත් තබමි දඩ
වටත් අයට දැනෙනටත් කියමි මම රටක් වටින සිහ රජ වන්නමෙ හැඩ
(තාලානුකූල හස්තචලන)

තානම- තනත් තනෙන තම්- දනත් තනෙන තම්
දනත් තනෙන තම් දන තානා.... තන
තනත් තනෙන තම්- දනත් තනෙන තම්
දනත් තනෙන තම් දන තානා....
(අලංකාර මාත්‍රය)

කස්තිරම- තකට තකට තක තරිකිට කුංදත් /// (සුරල්)
රුංතක ජිංතක ජිංතක ජිං කුඳ ///
තා ගජිංතක තරිකිට කුංදත් ///
රුංතක ජිංතක තරිකිට කුංදත් තා

සීරුමාරුව- තකු තක ජිජි කුඳ ගජිත ගජිත කුඳ
ගජි ගත කුඳ කුඳ තා (කඩතක) කුඳ කුඳ තා (කඩතක)
කුඳ කුඳ තාකු ජිත්ත ගත දොමිකිට තරිකිට කුංදත් තා

අඩව්ව- තාම් දොමිති ගත දොමි කිට කඩතක තරිකිට
කිතක දොමිති ගත කිත් තක් කුඳ කුඳ තාකු ජිත්ත ගත
දොමිකිට තරිකිට කුංදත් තා



- **9 ශ්‍රේණියේ දී උගත් ආකාරයට ගායනය කරන්න.**
- **ගොඩසරඹ ඇසුරින් අලංකාර මාත්‍රා 3ක් නිර්මාණය කර වන්නම නර්තනය කරන්න.**

# කාර්ය පත්‍රිකාව

1. උඩරට වන්නම් රචනා වී ඇත්තේ ..........:............... දීය.
2. උඩරට වන්නමක ව්‍යුහය ලියන්න.
3. උඩරට වන්නම් මුලින් රචනා වූයේ....................... සඳහාය.
4. සිංහරාජ වන්නමෙන් .................................. විස්තර වේ.
5. සිංහරාජ වන්නම····················· වන්නමක් ලෙස හඳුන්වයි.
6. සිංහරාජ වන්නම අදාල තාලරූපය අනුව ප්‍රස්ථාර කරන්න.
7. පහත වන්නම් පිළිබඳ විස්තර වන වාක්‍ය 3 බැගින් ලියන්න.
    - ❖ හනුමා වන්නම -
        -
        -
        -
    - ❖ තුරඟා වන්නම
        -
        -
        -
    - ❖ වෛරොඩි වන්නම
        -
        -
        -
    - ❖ සිංහරාජ වන්නම
        -
        -
        -